#mediaethicsSL #EnglishPress #Ika #DailyMirror

ඩේලි මිරර් පුවත්පතේ දේශපාලන කටකථා තීරුවේ පළවූ පුවතක සඳහන් වූයේ, පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයට පෙර හිටපු බලවතෙකු විසින් උතුරු සන්ධානයේ 'තිරන්' හට මඩකලපුවේ සයොන් පල්ලියේ පූජාවට නොයන ලෙසට තමන්ට ලැබුණු බුද්ධි තොරතුරු අනුව උපදෙස් දුන් බවත්, ඒ වෙනුවෙන් තිරන් විසින් හිටපු බලවතාට ස්තුති කළ බවත් වේ. මෙහි සඳහන් වන්නේ මහින්ද රාජපක්ෂ සහ සුමන්තිරන් සම්බන්ධයෙන් බව වටහා ගැනීමට එතරම් අපහසුවක් නොවුණේ, චිත්‍රයෙන්ද මෙය ඉදිරිපත් කොට තිබූ බැවිණි. කෙසේ වෙතත් සුමන්තිරන් මන්ත්‍රීවරයා විසින් මෙය අසත්‍යයක් බවට සිය ෆේස්බුක් පිටුව ඔස්සේ ප්‍රකාශයට පත් කළ අතර, ඩේලි මිරර් මගින් මේ සඳහා නිවැරදි කිරීමක් පළ කරයි. එයද දේශපාලන කටකථා තීරුවේම සඳහන් කෙරෙන අතර, එයින් පැවසෙන්නේ එම හිටපු බලවතා විසින් සන්ධානයේ තිරන් හට පවසා ඇත්තේ පාස්කු දින බෝම්බ පිපිරුමෙන් පසුව මඩකලපුවේ මැර කල්ලි ප්‍රහාරයක් සම්බන්ධයෙන් බවත්, ඉන් පෙර ඒ පළ වූ පුවත වැරදීමක් බවත් වේ.

කෙසේ වෙතත් සුමන්තිරන් මන්ත්‍රීවරයා විසින් නැවතත් ට්විටර් පණිවිඩයක් තබමින් පවසා සිටින්නේ මෙම නිවැරදි කිරීමද සාවද්‍ය බවයි. ඔහු පවසන්නේ පාස්කු ප්‍රහාරයෙන් පසුව මහින්ද රාජපක්ෂ තමන් සමගින් 22 දින කථා කළත්, අඩු තරමින් තමන් මඩකලපුවේ සිටි බවක් හෝ තමන් පවසන තෙක් නොදැන සිටි බවයි. මෙම ට්විටර් පණිවුඩයට සුමන්තිරන් මන්ත්‍රීවරයා විසින් ඩේලි මිරර් ට්විටර් ගිණුමද ඇඳයි.

මෙතැනින් එහාට ඩේලි මිරර් පුවත්පතේ මේ සම්බන්ධයෙන් දෙවන කරුණු පැහැදිලි කිරීමක් හෝ දෙවන නිවැරදි කිරීමක් මෙතෙක් පළ නොවෙයි. මේ අතරවාරයේදී සුමන්තිරන් මන්ත්‍රීවරයා විසින් කථානායකවරයාගෙන් තම වරප්‍රසාද කඩවීම සම්බන්ධයෙන් ඩේලි මිරර් පුවත්පතට එරෙහිව පියවර ගන්නා මෙන් ඉල්ලා සිටී. ඊට අමතරව දෙමළ ජාතික සන්ධානය මගින්ද මේ පිළිබඳව ප්‍රකාශයක් නිකුත් කරයි.

ඩේලි මිරර් පුවත්පත මගින් මෙහිදී දෙවන නිවැරදි කිරීමක් පළ කිරීම සහ කණගාටුව ප්‍රකාශ කිරීමක් සිදු කළ යුතු නොවන්නේද? එසේත් නැතිනම්, ඔවුන්ට තමන් පළ කරන්නට යෙදුණු පුවත සැබෑ යයි සනාථ කළ හැකි මූලාශ්‍රයක් හෝ තිබෙන්නේ නම්, එම පුවත නිවැරදි බවට හෝ ප්‍රකාශයක් නිකුත් කිරීම අවශ්‍ය නොවේද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද